# රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ
# ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ උපලේඛනගත තනතුරුවල පවත්නා පුරප්පාඩු 07ක් හා 2024 (නොවැම්බර්) වර්ෂයේදී ඇතිවීමට නියමිත පුරප්පාඩු 02ක් වශයෙන් පුරප්පාඩු 09ක් පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව මෙම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් පත් කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත අනුව අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාළ ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2025.03.20 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ 13, ගැටඹේ
පේරාදෙණිය

03. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව හා ඒවා පවතින ආයතන පිළිබඳ විස්තර පහත දැක්වේ.

- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
    - * අධ්‍යක්ෂ (පශු සම්පත් සැලසුම්) - තනතුරු 01

- සෞඛ්‍ය අමාත්‍යාංශය
    - * අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය, පශු වෛද්‍ය සේවා) - තනතුරු 01

- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
    - * අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය, පශු සම්පත් සැලසුම් සහ ආර්ථික, සත්ත්ව අභිජනන, මානව සම්පත්, පශු අණපනත් හා නීති) - තනතුරු 05
    - * ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරි - තනතුරු 01(සුදුසුකම් සම්පූර්ණ කළ පශු වෛද්‍ය නිලධාරීන්ට පමණක් අයදුම් කළ හැකිය)
    - * ලේඛකාධිකාරි (සත්ත්ව ආහාර)

04. සපුරා ලිය යුතු පොදු සුදුසුකම්

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 ශ්‍රේණියේ වසර තුනක (03) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සක්‍රිය සේවයේ නියුතු නිලධාරියෙකු වීම.

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති සක්‍රිය සේවයේ සිටින අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගන්නා නිලධාරීන් මනාපය අනුව අදාළ තනතුරුවලට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. අදාළ නිලධාරියා එම තනතුර භාර නොගන්නේ නම් ලකුණු ලබාගෙන ඇති අනුපිළිවෙල සහ නිලධාරියාගේ මනාපය අනුව ඊළඟට වැඩිම ලකුණු ලබාගත් නිලධාරියා එම තනතුරට පත් කරනු ලැබේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | ලබාදෙනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය | උපරිම ලකුණු 40<br>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 වන ශ්‍රේණියේ වසර 03ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලය ඉක්මවා සපුරා ඇති මුළු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා පහත ආකාරයට ලකුණු ලබාදෙනු ලැබේ.<br>අමතර සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු<br>/<br>එම ශ්‍රේණියේ වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය<br>X<br>අදාළ නිලධාරියාගේ අමතර සක්‍රිය හා සතුටුදායක සේවාකාලය<br>(අවුරුදු x 12 +මාස) |
| 2. කුසලතාවය | උපරිම ලකුණු 60<br><br><u>I.කාර්යසාධන ඇගයුම් (පූර්වාසන්න වසර 05හි) - ලකුණු 15</u><br>- විශිෂ්ඨ - ලකුණු 03<br>- සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 02<br>- සතුටුදායක - ලකුණු 01<br><br><u>II.ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ ඉදිරිපත් කිරීම - ලකුණු 10</u><br>- ඉදිරිපත් කරන කරුණු - ලකුණු 04<br>- සැකසුම, නිර්මාණය, ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 03<br>- පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාරය - ලකුණු 03<br><br><u>III.තනතුරට අදාළව පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය හා අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් - ලකුණු 10</u><br>- පශු සම්පත් ක්ෂේත්‍රයට ලබා දී ඇති දායකත්වය - ලකුණු 05<br>(එක් කාර්යයක් සඳහා ලකුණු 1 බැගින්. ආයතන ප්‍රධානියා මඟින් ලිඛිතව සනාථ කල යුතුයි.)<br>- අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් - ලකුණු 05<br><br>(සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් යොමුකරන ගැටළුවලට ලබාදෙන පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත්වීමෙන් පසු එම මණ්ඩලය විසින් නිලධාරියාට ඉහත අනු සංරචක දෙක සඳහා ලකුණු ප්‍රදානය කරනු ලැබේ.) |

**IV.<u>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 05</u>**

- පශ්චාත් උපාධිය, සමාන හෝ ඉහළ සුදුසුකම් - ලකුණු 05
- පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 02

**V.<u>වෙනත් සුදුසුකම් - ලකුණු 15</u>**

- පළාත්, ජාතික හා අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ
- ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ)
- අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රකාශන හෝ අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරාවල පළකරනු ලැබූ පත්‍රිකා
    - Full paper in peer reviewed journals, Book Chapters -ලකුණු 03
    - Extended abstracts ලකුණු -02
    - Abstracts ලකුණු -1.5
    - Newsletters /Leaflets ලකුණු - 01

(ඉහත එක් එක් අවස්ථා අතරින්, ආයතන ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර ඇති, ලේඛන මඟින් සනාථ කෙරෙන උපරිම අවස්ථා (05) සඳහා ලකුණු ලබාදෙනු ලැබේ).

**VI.<u>සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන නිපුණතාවය - ලකුණු 05</u>**

- පෙන්නුම් කරන ලද නායකත්ව කුසලතා ලකුණු 02
- සන්නිවේදන කුසලතා ලකුණු 02
- භාෂා හැකියාව ලකුණු 01

සැ.යු. :-

I. බඳවා ගැනීමේ දී හෝ උසස් කිරීමකදී මූලික සුදුසුකමක් ලෙස සහ/ හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සලකා නොබැලූ සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

II. උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමේදී උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

07. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරගන්නා ලද අයදුම්පත්‍රය, අදාළ අනෙකුත් ලේඛනවල විධිමත් පරිදි සහතික කරගන්නා ලද පිටපත් ඇතුළත් ගොනුවක් ද සමඟ යොමුකළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

දිනය - 2024/02/20